# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1540/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 03/10/2024 පැය 2045

**මාධ්‍ය නිවේදනය**

**මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පොලිස් මූලස්ථානයේදී පැවති විශේෂ සාකච්ඡාව - පොලිස් මූලස්ථානය.**

ශ්‍රී ලංකාව තුල ආන්දෝලනයට තුඩුදුන් ජාතික තලයේ අපරාධ, වංචාවන් සහ වෙනත් විශේෂ අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය මගින් පවත්වනු ලබන විවිධ විමර්ශනවල ප්‍රගතිය සොයා බැලීමක් මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් රවි සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් 2024.10.03 වන අද දින පොලිස් මූලස්ථානයේදී පවත්වන ලදී.

මෙහිදී දැනට සිදු කරගෙන යන විමර්ශන මොනවාද, තාවකාලිකව නවත්වා තිබෙන විමර්ශන වේ නම් ඒවා මොනවාද, එසේ නැවතීමට දේශපාලණික හේතු බලපා තිබෙනවාද, තවද අනවශ්‍ය ලෙස ප්‍රමාද වී තිබෙන විමර්ශන, අළුතෙන් ආරම්භ කළ යුතු විමර්ශන තිබේනම් ඒවා මොනවාද යන්න පිළිබඳවද විශේෂ අවධානය යොමු කර සාකච්ඡාවට භාජනය කරන ලදී. යම් යම් විමර්ශන සඳහා බලපෑම් සිදුවී තිබේද, එසේ නොමැතිනම් ප්‍රමාදවීමට හේතු මොනවාද යන්න පිළිබඳවද මෙහිදී අවධානය යොමු කර ඇත.

මෙම අවස්ථාව සඳහා වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකුද සහභාගි විය. අදාල කරුණු පිළිබඳව වාර්තාවක් සකස් කර ඉදිරි විමර්ශන සිදු කෙරෙන අතර, මෙහිදී වැදගත් වූ විමර්ශන රාශියක් පිළිබඳව අවධානය යොමු කර තිබිණි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**